

# නටනු හැකිනම් මහා වැස්සේ....
# If you can dance in the rain......





**ජීවිතය යනු මහා වැසි කුණාටුවකදී එයට අසුවී ඉන් බේරෙන හැකියාව නොවේ. ජීවිතය යනු ඒ වැස්සේ තෙමෙමින් නටන්නට ද ඇති හැකියාවයි.**

එය රෝහලේ කාර්යබහුල උදයකි. අටහමාරට පමණ වයස හැත්තෑ ගණනක්යයි කිවහැකි වයෝවෘද්ධ මහත්මයෙක් පැමිණ සිටියේය. ඒ ඔහුගේ අතේ මහපටැඟිල්ලේ තුවාල යකට දමා තිබූ මැහුම් කපාගෙන යළිත් එයට බෙහෙත් දමාගෙන යන්නට ය. තමාට උදේ නමය හමා රට කෙනෙකු මුණ ගැහෙන්නට තිබෙන බැවින් ඉක්මනින් යා යුතු බව ද කීවේය. මම ඔහුට ඉඳගන්නට සැලැස්සුවෙමි. ඔහුගේ තත්වය පිරික්සන්නට කෙනෙකු එන්නට තව පැයක් පමණ ගතවන්නට පුළුවන. ඔහු තම අත් ඔර්ලෝසුව දෙස වරින් වර බලනවා ද මම දැක්කෙමි. ඒවෙලේ මට කරන්නට මගේ අංශයේ එපමණ වැඩක් ද තිබුණේ නැත. බලන්නට ලෙඩෙකු ද නොවී ය. එනිසා මෙවෙලේ ඔහුගේ අතේ වූ තුවාලයේ තත්වය කෙසේදැයි පරීක්ෂාකරන්නට මට සිතිණ.

ඒ තුවාලය හොඳ අතට හැරී වේලී යමින් තිබුණේය. මම අපේ එක් වෛද්‍යවරයෙකු කරා ගොස් මෙම ලෙඩාගේ අතේ තුවාලයේ වූ මැහුම් කපා බෙහෙත් දැමීමට අවශ්‍ය දේවල් ද ඉල්ලා ගෙන යළිත් ඔහු ළඟට පැමිණියෙමි. තුවාලයට බෙහෙත් දමා වෙළුම් පටියකින් අත වෙලන අතරේ 9. 30 ට යොදාගෙන තිබෙන ගමන තවත් වෛද්‍යවරයෙකු බලන්නට යන්නට දැයි ඇසුවෙමි. නැතැයි කී ඔහු කාරණය කියන්නට පටන් ගත්තේ ය. ඒ මෙසේ ය.

ඔහු සැබැවින්ම යන්නේ වැඩිහිටි සාත්තු නිවාසයක නවත්වා සිටින ඔහුගේ බිරිඳ හමුවන්නට ය. ඇය දැන් (Alzheimer's Disease) ඇල්සයි මර් යන නමින් හඳුන්වන මතකය මුළුමනින් ගිලිහී යාමේ රෝගයෙන් පෙලෙන බව ද කීවේ ය.

ඇය ඒ රෝගයට ගොදුරුවී වසර 5 ක් වන අතර, මේ දක්වා ඒ කාලය මුළුල්ලේම ඇය හමුවී දින පතා කතා කරන නමුත් ඔහු කවුද කියාවත් ඇය දන්නේ නැති බව ද පැවසීය.

" ඔහේ බලාගත්තු අත බලාගෙන ඉන්නවා... එයා දැන් කොහෙත්ම මාව අඳුරන්නේ නැහැ...."

"ඒ වුනාට ඔබ හැමදාම උදේ නොවරදවා ඇයව බලන්නට යනවා නේ ?" මම ඇසුවෙමි. මගේ අතට හෙමින් තට්ටු කළ ඔහු සිනාවකින් යුතුව මෙසේ කීවේ ය.

" එයා දැන් මාව දන්නෙ නැහැ තමයි... ඒත් මම තවම දන්නවා නේ එයා කවුද කියලා....."

ඔහුට නැගිට පිටවී යන කල මගේ ඇසට නැගුණු කඳුල සඟවා ගෙන මම ඔහුට සුබපැතීමි. යම් දිනක මගේ ජීවිතයට ද අවශ්‍ය වන්නේ එවැනි ආදරයකි.

සැබෑ ආදරය යනු ශාරීරකව විඳින සුවය හෝ, ප්‍රේමයෙන් මන් මත්වීම හෝ නොවේ. සැබෑ ආදරය යනු මේ මොහොතේ හා, පසුගිය හා, ඉදිරියට ඇතිවිය හැකි හැම දේකම හා, ඇතිවිය නොහැකි හැම දේකම එකතුවෙන් උපන් හැඟීමකි. ඒ තත් වය කුමන දේකින්වත් යළිත් වෙනස් නොවන්නකි. ඒ සැබෑ ආදරයයි.

ප්‍රීතියෙන් සිටින අය යනු සැබැවින්ම හැම දේම ලැබී ඉන් සම්පූර්ණව සිටින අය නොවේ. තමන්ට ඇත්තේ සුළු දෙයින් වුවද, ඉන් සෑහීමට පත්ව එය තම යහපතට යොදා ගන්නා අයයි.

ජීවිතය කියන්නේ මහා වැසි කුණාටුවකදී එයට අසුවී ඉන් බේරෙන හැකියාව නොවේ. ජීවිතය යනු ඒ වැස්සේ තෙමෙමින් නටන්නට ද ඇති හැකියාවයි.

It was a busy morning, about 8. 30, when an elderly gentleman in his 80's arrived to have stitches removed from his thumb. He said he was in a hurry as he had an appointment at 9. 30 am.

I took his vital signs and had him take a seat, knowing it would be over an hour before someone would be able to see him. I saw him looking at his watch, and decided, since I was not busy with another patient, I would evaluate his wound.

On exam, it was well healed, so I talked to one of the doctors, got the needed supplies to remove his sutures and redress his wound.

While taking care of his wound, I asked him if he had another doctor's appointment this morning.

He said no, he needed to go to the nursing home to eat breakfast with his wife. I inquired as to her health.

He told me she had been there for a while and that she was a victim of Alzheimer's Disease.

As we talked, I asked if she would be upset if he was a bit late. He replied that she no longer knew who he was, she had not recognized him in five years now.

I was surprised, and asked him: " And you still go every morning, even though she doesn't know who you are? "

He smiled as he patted my hand and said, " True she doesn't know me now, but I still know who she is....."

I had to hold back tears as he left, I had goose bumps on my arm, and thought, " That is the kind of love I want in my life."

True love is neither physical, nor romantic.

True love is an acceptance of all that is, has been, will be, and will not be.

The happiest people don't necessarily have the best of everything; they just make the best of everything they have.


'Life isn't about how to survive the storm, but how to dance in the rain..'

*Deepa Sandamali Herath*

♦ **දීපා සඳමාලි හේරත්**

USA

# සෝම හිමි ගුණ සැමරුම් !



**" අතීතයේ රටත් ජාතියත් රකින්නට, සාසනේ රකින්නට ඉදිරිපත්වෙලා වැඩ කරපු භික්ෂූන් වහන්සේලා හිටියා. සමහර වෙලාවට යම් යම් ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්. මං මේ ආත්මෙ නිවන් දකින්න අදහසක් නෑ. මං හිතනව මං එතනට ගිහිල්ලා රටත් ජාතියත් ගොඩනගා, ජාතික සමගියත් ඇති කරලා, සම්බුද්ධ ශාසනේ ආරක්ෂාකරගෙන මේ කටයුත්ත කළොත් මට ඒක නිවන් දකින්න හොඳ පිං කමක් කුසල කර්මයක් වේවි. මං ඒ අරමුණෙන් වැඩ කරනවා. "**

***පූජ්‍ය ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේ 2002 ජනවිජය සංවත්සරයේ දී***

2003 දෙසැම්බර් 12 වෙනි දින පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි යන් අකාලයේ අපවත් වී වදාළේ මුළුමහත් ශ්‍රීලංකාවේ බෞද්ධ හා අබෞද්ධ ජනතාව ගේ දෑස්වලට උණු කඳුළු නංවමිනුයි. විචිත්‍ර ධර්ම කථික යාණන් කෙනෙකු වූ උන් වහන්සේ අප දේශය හා ජාතිය අද දවසේ වැටී සිටින නිවට නියාළු තත්වයෙන් හා දුශ්චරිත යෙන් මුදවාගෙන ධීර නිවහල් ජනතාවක් කරන්නට ඉමහත් වෙර දැරූ සුපේශල දහම්දර යතිවරයාණ කෙනෙක්. අප දැයට වූ පාඩුව මෙතෙකැයි කියන්නට බැරිතරම්. අපට ධෛර්යය එළිය දුන් ඒ පහන නිවීයෑම අපේ ම අභාග්‍යයි.

අපේ සෝම හාමුදුරුවන්ට උතුම් නිවන් සැප ම අත්වේවා!

♦ ***වරුණ***

## සෝම හාමුදුරුවෝ

පස්පවින් වැළකෙමින් බොදු සිරිත් රැක ගන්න
මුළු රටම එකතු වී බුදුසසුන රැක ගන්න
වඳව යන ජාතියක් සිහළුනේ රැක ගන්න
නැගිටින්න එකා මෙන් කියා ඔවදන් දුන්න

යොවුන් සිත් පුබුදුකර දහම් මග පෙන්නුවා
අයාලේ යන පිරිස් ළඟට ගෙන සැනසුවා
බුදුදහම බෙදා හැර තුන් හෙළය පුබුදුවා
හදිසියේ සෝමහිමි මුළු රටම හැඩවුවා

කහකොඩිය එසවුණා රට පුරා එක ලෙසට
හඩා වැටුණා සැවොම විසිහතර පැය දිගට
ගලාගිය ජන ගඟකි මුහුද ගැලුවා ලෙසට
හැමදෙනා පතනවා යළි එන්න මව් බිමට

♦ ***ප්‍රේමා සුරවීර රූපසිංහ***

**Nugegoda - Sri Lanka**

# අතීත විත්ති පික් පොකට් කතාවක්

**මෙයට අවුරුදු සීයකටත් පෙර පළකරන ලද සිංහල පත්‍රයක හොරකමක් ගැන ඇති වාර්තාව ඉතා රසවත් එකකි. එදා වාර්තාව ලියා ඇති ශෛලිය මෙන්ම හොරකමද පුදුම එකකි. 1878 මාර්තු 27 වෙනි දින සත්‍යාලංකාර නම් සිංහල පුවත්පතෙහි පළවූ ඒ පුවත මෙසේ ය.**

## සාක්කුවලින් සොරකම්කිරීම

දිස්ත්‍රික් නඩුකාර ලිවේරා උන්නාන්සේ පසුගිය ඉරිදා රත්නපුරයට කෝච්චි යෙන් යෑම පිණිස පිටකොටුවේ කෝච්චි කන්තෝරුවේ සිටිද්දී කොල් ලෙක් උන්නැහේගේ සාක්කුවට අත දමා එහි තිබුණු රුපියල් හැත්තෑවක් සොරකම්කර ගත්තේ ය. තවත් කොල්ලෙක් ඒ දුටු නිසා සොරා අල්ලාගත් නමුත් කාසි සම්භවුණේ නැත. ඒ ගැන වැඩිදුර විභාග කෙරෙති.

මීට සුමාන ගණනකට ප්‍රථම ලංකාවේ පොලීසිවල ප්‍රධාන තැන වන කැමල් උන්නැහේ සහ නෝනාත් නාගරික සභාවේ කඩ පිළේ ඇවිදිද්දී කොල්ලෙක් විසින් කැමල් නෝනාගේ සාක්කුවට අත දමා වටිනා බඩුවගයක් සොරකම් කරගත් බවත්, එහි සිටි කොල්ලෙකු ඒ දැක පොලිස්කාරයෙකුට දන්වා සොරා අල්ලාගත් බවත් සැලය. මහා රාජිණීන්ගේ අද්වකාත් උන්නාන් සේටත් මෙබඳු කාරණා සිදු වුනොත් ගැට කැපීම් සහ මෙබඳු සොරකම් ගැන තදබල රෙගුලාසි සාදනවා ඇතැයි සිතමු."

**(සත්‍යාලංකාර 1878 මාර්තු 27)**

***අභාවප්‍රාප්ත ජී. ටී. වික්‍රමසිංහ මහතා ලියා තිබූ ලිපියකිනි***



අපේ ආදරණීය පුංචි පුතා මෙලොව හැර ගියේය. අවසන් කටයුතු

**13.12.2010 දින උදේ 10 . 15 ට**

**South West Crematorium Hounslow Road Hanworth Feltham TW3 5JH**

හි දී සිදුවන බැව් කරුණාවෙන් සලකන්න!

## අවමංගල්‍ය OBITUARY

**චේලක මුතුකුමාරණ**

**Chelaka Mutukumarana**

**උපත - 11 - 06 - 2005**
**විපත - 03 -12 - 2010**

**ශෝකයට පත්**

***ගාමිණී මුතුකුමාරණ - පියා***
***ප්‍රියංගිකා ගොඩකන්ද - මව***
***ගිහාන් මුතුකුමාරණ - සොයුරු***

**Middx London**